මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | PE/COP/POLI/Circulars | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2022.10. 06 |

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 06/2022

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

රාජ්‍ය සංස්ථා (රාජ්‍ය බැංකු ද ඇතුළුව), ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල සභාපතිවරුන්

**<u>රජය සතු ව්‍යවසායයන්හි සේවකයින් විශ්‍රාම ගැන්වීමේ වයස සංශෝධනය කිරීම</u>**

2021 අංක 30 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා ගරු මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින් 2022.08.30 දින ඉදිරිපත් කරන ලද 2022 වර්ෂය සඳහා වූ අතුරු අයවැය කතාවෙහි අංක 11.2 යෝජනාව මත පදනම්ව හා 2022.10.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රජය සතු ව්‍යවසායයන්හි සේවයේ නියුතු සේවකයින්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස හා ඒ සම්බන්ධයෙන් වූ කොන්දේසි පහත පරිදි සංශෝධනය කෙරේ.

I. මෙම චක්‍රලේඛයේ III වන ඡේදයේ කොන්දේසිවලට යටත්ව, 2023.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි රජය සතු ව්‍යවසායයන්හි සේවකයින්ගේ වෛකල්පිත විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 55ක් වන අතර කිසියම් නිලධාරියෙකු වයස අවුරුදු 55 ඉක්මවා සේවයේ යෙදීමට අදහස් කරන්නේ නම්, සේවා දීර්ඝ කිරීමේ ඉල්ලීමක් නොමැතිව අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 දක්වා සේවයේ යෙදිය හැකිය.

II. අවුරුදු 55 සිට 60 අතර කාල පරිච්ඡේදය තුළ නිලධාරියාගේ අභිමතය පරිදි පත්වීම් බලධරයා වෙත මාස 3 ක පූර්ව දැනුම්දීමක් කිරීමෙන් අනතුරුව විශ්‍රාම ගත හැකිය.

III. කාර්යක්ෂමතාවය හා කාර්යසාධනය සතුටුදායක නොවන නිලධාරියකුට වයස අවුරුදු 55 න් ඔබ්බට සේවා දීර්ඝ කිරීමක් ලබා නොදීමට පත්වීම් බලධරයා තීරණය කරන්නේ නම්, එයට එරෙහිව නිලධාරියාට අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සැලසෙන ආකාරයෙන් මාස 6ක පූර්ව දැනුම්දීමකින් පසුව එම සේවකයා විශ්‍රාම ගැන්වීමේ බලය පත්වීම් බලධරයා සතුවේ.

IV. වසය අවුරුදු 60 ඉක්මවා දැනට සේවයේ යෙදී සිටින සහ 2022.12.31 දින හෝ එදිනට පෙර වයස අවුරුදු 60 සම්පූර්ණ වන රජය සතු ව්‍යවසායයන්හි සේවකයන් 2022.12.31 දිනට හෝ ඊට ප්‍රථම අනිවාර්යයෙන්ම විශ්‍රාම ගත යුතුය.

2021.12.14 දිනැති හා අංක 02/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මෙයින් අවලංගු වේ.

මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් අවශ්‍ය නම්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ( දු.අ. 011-2484617) හෝ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ( දු.අ. 011-2484627) අමතා ලබා ගත හැකිය.

කේ.එම්. මහින්ද සිරිවර්ධන
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, ජාතික වැටුප් හා සේවක කොමිෂන් සභාව